(පහත දැක්වෙනුයේ HNB ඇෂුවරන්ස් පොදු සමාගමේ 2019 සංකලිත වාර්ෂික වාර්තාවේ පිටු අංක 14-17 හි සඳහන් සභාපතිතුමියගේ පණිවිඩයේ සිංහල පරිවර්තනයක් පමණි.)

## සභාපතිතුමියගේ පණිවිඩය

**හිතවත් කොටස් හිමියනි,**

HNB ඇෂුවරන්ස් PLC හි 18 වැනි වාර්ෂික මහ සභා රැස්වීමට ඔබ සාදරයෙන් පිළිගන්නා අතර 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මූල්‍ය වර්ෂය සඳහා සමාගමේ කාර්ය සාධනය පිළිබඳ තුලිත දැක්මක් ලබා දෙන සමාගමේ වාර්ෂික වාර්තාව ඔබට ඉදිරිපත් කිරීමට ලැබීම ඉමහත් සතුටකි. HNB ඇෂුවරන්ස් සමාගම වාර්තා කරන කාලය තුළ රු. බිලියන 1.4 ක බදු පෙර ලාභයක් වාර්තා කර ඇති බවත් රු. බිලියන 26.6 ක් දක්වා වූ 20% ක වත්කම් වර්ධනයක් ලබා ඇති බවත් සතුටින් දන්වා සිටිමි. මෙම කාරණය ප්‍රශංසනීය වන්නේ සමාලෝචිත වර්ෂය තුළ බහුවිධ අභියෝග රැසක එක්වීමක් වීමත් එම අභියෝග ජයගැනීම සඳහා පාර්ශ්වකරුවන්ට දිගුකාලීන වටිනාකම් ලබා දීම අරමුණු කරගෙන නම්‍යශීලීභාවය හා රඳා පැවැත්මේ හැකියාව වර්ධනය කිරීමට ක්‍රමෝපායන් යෙදීමත් නිසාය. බොහොමයකගේ වටිනාකම් අඩු වූ වර්ෂයක, අප සමාගමේ වෙළඳපොළ ප්‍රාග්ධනකරණය රු. බිලියන 6.9 ක් දක්වා 5% කින් ඉහළ යාම තුළින් අපගේ කොටස් හිමියන්ගේ වටිනාකම ප්‍රවර්ධනය කිරීම සඳහා අප ගත් ක්‍රමෝපායන්ගේ සාර්ථකත්වය පිළිබිඹු වේ.

### අවිනිශ්චිතබව සම්මතය වේ (Uncertinity is the Norm)

ගෝලීය ඉදිරි දැක්මේදී ද, දේශීය ඉදිරි දැක්මේදී ද අවිනිශ්චිතභාවය සම්මතයක් වී ඇත. මධ්‍යස්ථ වූ ආර්ථික වර්ධනය, කාලගුණික වෙනස්කම්, භූ දේශපාලනික අභියෝග, ත්‍රස්තවාදය, තාක්ෂණික සහ සාමාජීය නොසන්සුන්කාරීත්වයන් එක්ව මෙම අවිනිශ්චිතතාවය නිර්මාණය කරයි. 2019 වසර තුළ මෙය මනාව පිළිබිඹු විය. 2019 වසර සඳහා වූ ගෝලීය වර්ධනයන් සඳහා වූ පුරෝකතනයන් ආපස්සට ප්‍රතිශෝධනය කළ අතර පහළට ඇති අවදානම් වැඩි වීමත් ඉහළ විභවයන් අඩු වීමත් නිසා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් ගෝලීය ආර්ථික වර්ධනය 2019 ජනවාරි මස 3.5% සිට 2020 ජනවාරි මස වන විට 2.9% දක්වා ප්‍රතිශෝධනය කර තිබේ. එක්සත් ජනපදය සහ චීනය අතර ඇති වෙළඳ ආතතිය වසර පුරාම ගෝලීය වෙළඳාම කෙරෙහි සැළකිය යුතු බලපෑමක් ඇති කරන කාරණයක් ලෙස සාකච්ඡාවට භාජනය වූ ප්‍රධාන මාතෘකාවක් වූ අතර, 2020 ජනවාරි පුරෝකතනයන් තුළ වෙළඳ ගනුදෙනු පිළිබඳ වරින්වර පවත්නා හිතකර පුවත් තුළින් එහි යම් ලිහිල් බවක් දක්නට ලැබුණි. දැඩි මූල්‍ය තත්ත්වයන් තුළ අප මහ බැංකුව ද ඇතුළත්ව මහ බැංකු 20 ක් හිමිකම් අනුපාත (Policy Rates) අඩු කර මුදල් ප්‍රතිපත්තිය මත වඩා ඉඩ සළසන ස්ථාවරයක් තෝරාගත් අතර එමගින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් 2020 සඳහා වූ පුරෝකතනය වන 3.3% ට 0.5% ක උත්තේජකයක් එක් කලේය. 2020 ජනවාරි 31 දින එක්සත් රාජධානිය යුරෝපා සමුළුවෙන් ඉවත් වූ අතර එක්සත් රාජධානිය යුරෝපා සංගමය සමඟ නව වෙළෙඳ ගිවිසුමක් ඇතිකර ගැනීමට උත්සාහ දරන නිසා එහි අතරුඵල 2020 පුරාම මතුවනු ඇත. එක්සත් රාජධානිය සහ ඉරානය අතර භූ දේශපාලනික ආතතිය ද මෙම වසර තුළ දී මතු විය. එය ක්ෂණිකව ප්‍රධාන අවදානමක් බවට පත්වූයේ ඉහළ වර්ධන අනුපාතයක් පුරෝකථනය කිරීමේ ප්‍රධාන නිර්ණායකයක් වන තෙල් සැපයුමට එමගින් අහිතකර බලපෑමක් එල්ල වීමට මුල් අවස්ථාවේ හැකියාවක් තිබීමත් පසුව ස්ථාවර බවට පත්වීමේ අස්ථිර ලකුණු පහළ වීමත් නිසාය.

ශ්‍රී ලංකාවේ අත්දැකීම ද අවිනිශ්චිතතාව පදනම් කරගෙන සටහන් විය. ජනාධිපතිවරණ, වෙළෙඳ සහ අයවැය හිඟයන් සහ ඉහළ යන පොළී අනුපාත, ව්‍යාපාර ක්‍රියාත්මක වීම සඳහා වන පරිසරය ආතතියකට ලක් කිරීමට එක් විය. ඒ සමඟම දේශපාලනික හා ප්‍රතිපත්තිමය අවිනිශ්චිතභාවය ආර්ථික වර්ධනය කෙරෙහි දැඩි බලපෑමක් එල්ල කලේය. පුළුල් වන වෙළඳ සහ අයවැය පරතරය පියවීම සඳහා සහ එමඟින් විනිමය සහ පොළී අනුපාත මත ඇතිවන බලපෑම අවම කිරීම සඳහා මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග කිහිපයක් ආරම්භ කරන ලදී. මේ සඳහා මෝටර් වාහන සහ අත්‍යවශ්‍ය නොවන පාරිභෝගික භාණ්ඩ ආනයනය සීමා කිරීම සම්බන්ධ බාධාවන් ඇතුළත් වූ අතර එය

2019 සැප්තැම්බර් මස ලිහිල් කර තැන්පතු අනුපාත මත සීමා නියම කිරීම ආරම්භ වූ අතර පසුව එය ණය දීමේ අනුපාත අඩු කිරීමේ ක්‍රියාමාර්ග සඳහා යොදාගන්නා ලදී. පාස්කු ඉරුදින ප්‍රහාරය තුළ ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් ඕනෑම පැතිකඩක් පිළිබඳ උදාසීනත්වයක් තිබීම සමාජ සහ ආර්ථික ස්ථාවරභාවයට දැඩි ලෙස බලපෑම් එල්ල කරන බව පැහැදිලි වූ අතර දළ දේශීය නිෂ්පාදිතය (Gross Domestic Product - GDP) 2019 පළමු කාර්තුවේ 3.8% සිට දෙවන කාර්තුවේ 1.5% දක්වා පහළ බසින ලදී. මේ නිසා සංචාරක ක්ෂේත්‍රයේ ඇතිවීමට තිබූ වර්ධනය අඩාල වූ අතර එම නිසා කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත වලට සහ අනෙකුත් ක්ෂේත්‍ර වලටත් අයහපත් බලපෑම් එල්ල වීම නිසා ඒවාට පසුව ණය පමාසහන වැනි සහන ලබා දෙන ලදී. 2020 සඳහා ගෝලීය ඉදිරි දැක්ම මෙන්ම ස්ථාවර වීමේ පූර්ව සංඥා අපට නොවැම්බර් සහ දෙසැම්බර් මාසවල සංචාරකයන්ගේ නැවත පැමිණීම 2018 මට්ටමට සිදුවීම සහ 2019 තුන්වන කාර්තුවේ දළ දේශීය නිශ්පාදිතය 2.7% ට වැඩිවීම තුළ දක්නට ලැබුණි.

## කර්මාන්තය පිළිබඳ සමාලෝචනය (Industry Overview)

මෙම අභියෝග අතර රක්ෂණ කර්මාන්තය 2019 වර්ෂයේ දී යහපත් වර්ධනයක් පෙන්නුම් කළ අතර දළ ලේඛණගත රක්ෂණ වාරිකයේ (Gross Written Premium) වර්ධනය දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනයට වඩා ඉහළ අගයක් පෙන්විය. 2018 දී රක්ෂණ වාරික දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස (Insurance Penetration) 1.5% ක් වූ අතර අඩු වැයකල හැකි ආදායම් (Disposable Income) නිසා එය සාපේක්ෂ වශයෙන් වෙනස් නොවන තත්වයක තිබේ යැයි අපේක්ෂා කරයි. ඉහළ පොළී අනුපාතයන් සහ කොටස් වෙළඳපොළ ආයෝජන වලට අවම වත්කම් වෙන්කිරීම නිසා ආයෝජන ආදායම වසර තුළ වැඩි වීමක් දක්නට ලැබුණි. කෙසේ වෙතත් ජීවිත රක්ෂණ ක්ෂේත්‍රයේ අඩු වූ ලාභදායකත්වය නිසා කර්මාන්තයේ ලාභදායකත්වය අඩු වූ අතර, එයට ප්‍රධාන හේතුව වන්නේ වෙළඳපොළ සාමාජිකයන් වැඩි වීමත් ලාභ අනුපාත මත නිරන්තර පීඩනයත් වේ.

රක්ෂණ ක්‍ෂෙත්‍රයේ මුළු වත්කම් ප්‍රමාණය 2019 තුන්වන කාර්තුව වන විට රු. බිලියන 690 ක් දක්වා වැඩි වූ අතර ජීවිත රක්ෂණ ක්ෂේත්‍රය වත්කම් වලින් 70% ක් ආවරණය කරයි. කෙසේ වෙතත් හිමිකම් අඩුවීම පිළිබඳ ව කර්මාන්තය සමස්ථයක් වශයෙන් අවධානය යොමු කළ යුතු තත්ත්වයක් ඇති කරයි.

මෙම අංශයේ නියාමනය ගෝලීය වර්ධනයන්ට අනුව විකාශය වීම සිදුවිය. ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 17 (IFRS 17) 2022 ජනවාරි මස සිට යොදාගැනීමට තිබෙන යෝජනාව සැළකිය යුතු වෙනසක් ඇතිකරනු ඇති අතර එහි බලපෑම් වල වෙළඳපොල අවබෝධය තහවුරු කිරීම සඳහා එහි පාර්ශවකරුවන් සහ නියාමකයන්ගේ ක්‍රියාශීලී ක්‍රියාකාරිත්වය අවශ්‍ය වේ. සියළුම සමාගම් සඳහා ආයතනික යහපාලනය පිළිබඳ යහ පුරුදු සංග්‍රහය අනිවාර්ය කිරීම මත ආයතනික යහපාලනය ( Corporate Governance) ද තවදුරටත් ශක්තිමත් කර තිබේ.

## ශීඝ්‍ර වර්ධනය (Agile Growth)

රටෙහි වේගයෙන්ම වර්ධනය වන රක්ෂණ සමාගම බවට පත්වීමේ අපේ අපේක්ෂාව වටහා ගනිමින් කර්මාන්තයේ වර්ධන වේගයට වඩා ඉහළ වර්ධන වේගයක් පවත්වාගනිමින් අතිශය අභියෝගාත්මක මෙහෙයුම් පරිසරයක් තුළ රු. බිලියන 9.9 ක දළ ලේඛණගත රක්ෂණ වාරිකයක් සහිතව 2019 සඳහා 14% ක ඉහළ මට්ටමේ වර්ධන වේගයක් පවත්වාගැනීමට HNBA සමූහයට හැකිවූ බව වාර්තාකිරීමට ලැබීම පිළිබඳව මම ඉතාමත් සතුටට පත්වෙමි. ජීවිත රක්ෂණයේ වර්ධනය 17% ක් ද, සමාන්‍ය රක්ෂණය 11% ක් ද වශයෙන් යහපත් වර්ධනයක් පෙන්නුම් කළ අතර දළ ලේඛණගත රක්ෂණ වාරිකය පිළිවෙලින් රු. බිලියන 5.2 ක් සහ රු. බිලියන 4.8 ක් විය. ජීවිත රක්ෂණ සමාගමේ නව ව්‍යාපාර වාරිකය (New Business Premium) පසුගිය වසර තුළ 28% ක වර්ධනයක් පෙන්නුම් කළ අතර එමගින් අප සමාගමට MDRT සුදුසුකම් ලබන්නන් 75 ක් බිහිකිරීමට හැකිවූ අතර එය සමාගම ආරම්භයේ සිට බැලූ විට එය ඉහළම සංඛ්‍යාව වේ. ගනුදෙනුකරුවාට සහ HNBA සමාගමට යන දෙපාර්ශවයටම වටිනාකම් ඇති කිරීම සඳහා අවස්ථාවන් සහිත අංශ සොයාගැනීමට උත්සාහ කරන අතර නම්‍යශීලීබව සහ නවෝත්පාදනය, වර්ධනය ඇතිකිරීමේ ප්‍රධාන මාර්ගයන් වේ. අපගේ වර්ධනය සඳහා බැන්කු රක්ෂණ වැනලය මූලික දායකත්වයක් සැපයූ අතර අපගේ මව් සමාගමේ ශක්තිමත් දේශීය අධිකාරිත්වය තුළින් අපගේ වර්ධනයට සහායක් ලැබේ.

බදු පෙර ලාභය රු. බිලියන 1.4 ක් වන අතර එය අගය කළ යුතු වන්නේ 2018 බදු පෙර ලාභය අනුව බලන විට එක් වරක් පමණක් ඇතිවන අතිරික්තය (One-off Surplus) වූ රු. මිලියන 381 ක හැර 17% ක වර්ධනයක් පෙන්නුම් කිරීම තුලිනි. ප්‍රවේශම්සහගත අවදානම් තෝරාගැනීම ලාභදායිත්වය වර්ධනය වීමට ප්‍රධාන හේතුව වන අතර හිමිකම් පෑම් සහ ප්‍රතිලාභ ගෙවීම් 12 % ක වැඩිවීමක් සමඟ රු. බිලියන 3.6 ක තිබෙන අවස්ථාවක මෙම ජයග්‍රහණය ළඟාකරගෙන තිබීම විශේෂත්වයයි. බදු පසු ආදායම රු. බිලියන 2.7 සිට රු. බිලියන 1.01 දක්වා 2019 වර්ෂයේදී පහත බැස තිබෙන අතර එයට ප්‍රධාන හේතුව වන්නේ බදු අයකිරීම් වල සැළකිය යුතු වෙනස්කම් සිදුවීම තුළ 2018 ආදායම් බදු සඳහා රු. බිලියන 1.12ක් වූ ඍණාත්මක අයකිරීමේ සිට 2019 රු. මිලියන 395 වූ ධන අයකිරීමකට වර්ධනය වීමයි.

**ස්ථාවරත්වය** ගොඩනැගීම (Building Resilience)

ශක්තිමත් ශේෂ පත්‍ර වර්ධනය, යහපත් පාලනය සහ දූරදර්ශී අවදානම් කළමනාකරණය අධ්‍යක්ෂක මණ්ඩලයේ මූලික අරමුණු විය. HNBA හි ශේෂ පත්‍රය හෙවත් මුළු වත්කම් 2019 දී රු. බිලියන 26.6 දක්වා 20% කින් වර්ධනය වූ අතර රු. බිලියන 6.7 ක් දක්වා 17% ක් වන ශක්තිමත් හිමිකම් ප්‍රාග්ධනයේ වර්ධනයක් මගින් එයට සහය ලැබී තිබේ. HNBA හි ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය (Capital Adequacy Ratio) වසර අවසානයේ 309% ක් වූ අතර HNBGI සම්බන්ධයෙන් එය 223% ක් විය. එය කර්මාන්තයේ සාමාන්‍යට වඩා ඉහළ අගයක් වීම විචක්ෂණ අවදානම් කළමනාකරණය පිළිබිඹු කරයි. ෆිච් රේටිං ලංකා සමාගම (Fitch Ratings Lanka Limited) විසින් නිකුත් කරන ජාතික රක්ෂක මූල්‍ය ශක්ති ශ්‍රේණිගතකිරීම් (National Insurer Financial Strength Rating) A(lka) ධනාත්මක දැක්මකින් යුතුව මෙය තහවුරු කර තිබේ.

කාර්ය සාධනයේ මූලික පැතිකඩ පිළිබඳ අධ්‍යක්ෂක මණ්ඩලයේ සහ එහි උපකමිටු වල නිරන්තර අධීක්ෂණය සහිත ශක්තිමත් ආයතනික යහපාලනය, ස්ථාවරභාවය ගොඩනැගීම සඳහා වන මූලික මාර්ගයයි. අධ්‍යක්ෂක මණ්ඩලය සහ සමාගමේ ජ්‍යෙෂ්ඨ නායකත්වය අතර ඇතිවන ඉහළ මට්ටමේ සම්බන්ධතාවය පැහැදිළි සන්නිවේදනයක් සඳහා මග සළසයි. ප්‍රතිපත්ති රාමුව සමාලෝචනය තුලින් ප්‍රතිලාභ හා ගෙවීම් අතර පැහැදිලි සම්බන්ධයකට මඟ සැදුන අතර සමාගමේ අරමුණ පුද්ගල අභිමතාර්ථ හා අනුගත කිරීම තුලින් සමූහය තුළ යෝග්‍ය පරිසරයක් නිර්මාණය විය.

පාර්ශවකරුවන්ට ලබා දෙන වටිනාකම (Value to Stakeholders)

අපගේ ගමන් මග තුළ තවත් සන්ධිස්ථානයක් සනිටුහන් කරමින්, වැඩිදියුණු කරන ලද සාමන්‍ය ලාභය පෙරදැරිකොටගෙන අපගේ කොටස් හිමියන්ට එක් සාමාන්‍ය ඡන්ද කොටසකට රු. 2/- ක් වටිනා, රු. මිලියන 100 ක මුදල් අතුරු ලාභාංශයක් ලබා දී තිබෙන බව ඔබට දැනුම් දීමට ලැබීම පිළිබඳ මම ආඩම්බර වෙමි. අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අවසන් ලාභාංශයක් ලෙස රු.6 ක ප්‍රමාණයක් එක් කොටසකට ලබා දීම නිර්දේශ කර තිබෙන අතර එය රැස්වීම පිළිබඳ දැනුම් දීමේ දැන්වීමෙහි ඔබගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කොට ඇති අතර එමගින් තවත් රු. මිලියන 300 ක ප්‍රමාණයක් අප කොටස් හිමියන් අතට පත් වනු ඇත. කළින් සඳහන් කළ පරිදි මුදල් ලාභාංශ වලට එක් වෙමින් අපගේ වෙළඳපොල ප්‍රාග්ධනය රු. මිලියන 300 කින් වැඩි විය. සැළකිය යුතු කාරණය වන්නේ HNBA හි කොටසක වටිනාකම වසර අවසානයේ රු.138 ක් වූ අතර එය එක් කොටසකට රු. 134.30 ක් වූ ශුද්ධ වත්කම් වටිනාකමට වඩා ඉහළ අගයක් වීමත් එමගින් කොටස් හිමියන්ට එකතු වූ නෛසර්ගික වටිනාකම පිළිබිඹු වීමත් තුළ එය කළමනාකාරිත්වය විසින් මූල්‍ය නොවන වත්කම් මනා ලෙස කළමනාකරණය කිරීම අවධාරණය කරයි. වසර තුළ S&P 20 හි අප කෙටිකාලීනව ඇතුලත් වීම අපගේ කොටස් හිමියන්ට අප ලබාදුන් වටිනාකම මතු කර දක්වන අතර ඉන් පසුව එම ලැයිස්තුවෙන් ඉවත් කිරීම ප්‍රමාණවත් නොවන ද්‍රවශීලතාව නිසා සිදුවූ අතර එයට හේතුව අනාගතයේ වටිනාකම් ලබා දීමට අපට ඇති හැකියාව පිළිබඳ ගනුදෙනුකරුවන් තැබූ විශ්වාසය නිසා ඔවුන් අපගේ කොටස් වලින් ඉවත් නොවීම යි.

දැක්ම (Outlook)

අවිනිශ්චිතතාව සම්මතය වන විට ක්ෂණික කම්පනයන් හෝ වටිනාකම පහළ යාමේ අවදානම් වලට මුහුණ දීමට සිදු වුවහොත් අප සමූහයේ ස්ථාවරභාවය ගොඩනැගීමට එයට මුහුණ දීම සඳහා අපගේ ක්‍රමෝපායන් නම්‍යශීලී වීම වැදගත් වේ. අපගේ අපේක්ෂාවන් ළඟා කර ගැනීමට අප තුළ ඇති හැකියාව ඔප්පු කර පෙන්වන විට අපගේ ඉලක්ක තවතවත් ඉහළ යාම සිදුවේ. HNBA හි අපේක්ෂාව වන්නේ අපගේ සියළු පාර්ශවකරුවන්ට වටිනාකමක් ලබා දීමේ අධිෂ්ඨානය පෙරදැරිව සේවා විශිෂ්ටත්වය, පාර්ශවකරුවන්ට වටිනාකම් ලබා දීම, සේවක තෘප්තිය, ඩිජිටල් පරිවර්තනයන්, නවෝත්පාදක විශිෂ්ටත්වය සහ සමාජ භාරකාරත්වය පිළිබඳ අවධානය යොමු කරමින් 2020 දී ක්ෂේත්‍රයේ විශිෂ්ඨතම රක්ෂකයා (Best in Class Insurer 2020) වීමයි. මෙම තේමාවෙන් නැගී එන වෙළඳපොල අවස්ථාවන්, අභියෝග සහ නම්‍යශීලී ක්‍රමෝපායන් සඳහා අවශ්‍ය වන ප්‍රවණතාවන් පිළිබඳ විවෘත මනසක් තබා ගැනීම සඳහා වූ නම්‍යශීලි භාවය සඳහා ඉඩ ලබා දෙයි. අප ඉතාමත් ශක්තිමත් පදනමක් මත ආරම්භ වූ අතර අපගේ පාර්ශවකරුවන්ට ශක්තිමත් වටිනාකමක් ලබා දෙමින් අපගේ කාර්ය මණ්ඩලය තුළ, ආයෝජන කළඹ තුළ සහ ශේෂ පත්‍රයන්හි ස්ථාවර බව ගොඩනගා තිබේ.

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 17 (SLFRS 17 - Insurance Contracts) 'රක්ෂණ ගිවිසුම්' වලින් සිදුවන බලපෑම සම්බන්ධයෙන් ද අපි සූදානම් වන අතර එය කර්මාන්තය තුළ සිදුවන මහත් විපරිණාමීය ප්‍රතිසංස්කරණය නිසා එහි බලපෑම් තක්සේරු කිරීම ආරම්භ කර තිබේ. අපගේ පෙර සූදානම නිසා එම පරිවර්තනයන් කම්පන අවම කරමින් කළමනාකරණය කරගැනීමට අපට හැකියාව තිබෙන බව මාගේ විශ්වාසයයි.

ඇගයීම (Appreciation)

අප සමාගමට විශාල සම්පතක් ලෙස මා සළකන කළමනාකාර අධ්‍යක්ෂක/ප්‍රධාන විධායක නිලධාරී දීප්ති ලොකුආරච්චි මහතා විසින් මෙහෙයවන HNBA හි කණ්ඩායම් දෙක වෙහෙස නොබලා වසර පුරා ආයතනයේ සාරධර්ම වලට අනුකූලව තුලිත කාර්යය සාධනයක් තුලින් ආයතනික වටිනාකම්, පාර්ශවකරුවන්ගේ විශ්වාසය ගොඩනැගීම සම්බන්ධයෙන් සිදු කරන කටයුතු වෙනුවෙන් එම කණ්ඩායම් දෙක මම අතිශය අගය කරමි. ඔවුන්ගේ අනාගතය සුරකින 'ආරක්ෂක දැලක් එලීමට' අප කෙරෙහි විශ්වාසය තැබූ අපගේ ගනුදෙනුකරුවන් හට ස්තූතිවන්ත වන අතර ඔවුන්ගේ නීත්‍යානුකූල හිමිකම් ගෙවීමට ඇති අපගේ හැකියාව පිළිබඳව නිරන්තරයෙන් පරීක්ෂාකාරීව පසුවන බව තහවුරු කරමි. එසේම පසුගිය කාලය පුරාම අපගේ වර්ධනයට සහය ලබා දුන් අපගේ ව්‍යාපාර සහයකයන්ට මම ස්තුති කරන අතර ඉදිරියටත් ඔවුන්ගේ සහාය බලාපොරොත්තු වෙමි. එසේම HNB ඇෂුවරන්ස් PLC සහ HNB ජෙනරල් ඉන්ෂුවරන්ස් සීමාසහිත සමාගමෙහි අධ්‍යක්ෂක මණ්ඩලයන්ට ඔවුන් ලබා දුන් නොසැලෙන සහය, වටිනා දායකත්වයන් සම්බන්ධයෙන් සහ මෙම සමාගම ඉහළ තත්ත්වයකට නගා සිටුවීමේ දී මට ලබා දුන් සහය වෙනුවෙන් මාගේ ස්තූතිය පිරිනමමි.

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව (Insurance Regulatory Commission of Sri Lanka – IRCSL) විසින් නියාමකයෙක් වශයෙන් ලබා දුන් සහය සහ මග පෙන්වීම වෙනුවෙන් මම මාගේ අවංක ස්තූතිය පරිනමමි. 2020 ක්ෂේත්‍රයේ විශිෂ්ඨතම රක්ෂකයා වීමේ අපගේ අපේක්ෂාව තුළ HNB ඇෂුවරන්ස් PLC නව මානයකට ඔසවා තැබීම සඳහා කොටස් හිමියන් අප වෙත තැබූ විශ්වාසය වෙනුවෙන් අප අධ්‍යක්ෂක මණ්ඩලයේ සහ මාගේ ස්තූතිය පිරිනමමි.

මෙයට විශ්වාසී,

සභාපතිනිය

රෝස් කුරේ මහත්මිය

(පහත දැක්වෙනුයේ HNB ඇෂුවරන්ස් පොදු සමාගමේ 2019 සංකලිත වාර්ෂික වාර්තාවේ පිටු අංක 18-20 හි සඳහන් කළමනාකරණ අධ්‍යක්ෂකතුමාගේ විවරණයේ සිංහල පරිවර්තනයක් පමණි.)

**කළමනාකරණ අධ්‍යක්ෂකතුමාගේ විවරණය**

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මූල්‍ය වර්ෂය සඳහා HNB ඇෂුවරනස් PLC ආයතනයේ අටවැනි සංකලිත වාර්ෂික වාර්තාව සතුටින් ඉදිරිපත් කරමි. අප සමූහය රු. බිලියන 1.4 ක බදු පෙර ලාභයක් වාර්තා කරමින් 2018 වසර අවසානයේ අප සමාගමේ වාර්තා වූ එක් වරක් පමණක් වන අයිතයමන් ඇතුළත් නොවූ බදු පෙර ලාභයට සාපේක්ශව 17% ක වර්ධනයක් ලබා තිබෙන බව ද සතුටින් දන්වමි. සමූහයේ දළ ලිඛිත රක්ෂන වාරිකයෙහි (Gross Written Premium) 14% ක් වූ ස්ථිර සහ ස්ථාවර වර්ධනය මෙහිලා මූලික දායකත්වයක් දක්වන අතර 2019 වසර අවසානයේ ජීවිත සහ සාමාන්‍ය රක්ෂණ කර්මාන්තයේ වර්ධනය පිළිවෙලින් 11% ක් සහ 5% ක් වශයෙන් අධි කාර්යසාධනයක් සමූහය විසින් පවත්වාගෙන යාම සැළකිය යුතුය. ශක්තිමත් වර්ධනයක් පෙන්නුම් කරමින් ජීවිත සහ සාමාන්‍ය යන රක්ෂණ ක්ෂේත්‍ර දෙකෙහිම සමාගමේ මුළු වත්කම් (Total Assets) ප්‍රමාණය රු. බිලියන 26.6 ක් දක්වා 20% කින් වර්ධනය විය. කළමනාකාරිත්වය යටතේ (Funds Under Management) ඇති අරමුදල් රු. බිලියන 22 ක් දක්වා වර්ධනය වූ අතර එමගින් ආයෝජන සඳහා අතිරේක මාර්ග විවර විය. ජාතික රක්ෂන මූල්‍ය ශ්‍රේණි ගත කරනය (National Insurer Financial Strength Rating) වර්ගීකරණය අනුව HNB ඇෂුවරන්ස් PLC සහ HNB ජෙනරල් ඉන්ෂුවරන්ස් සීමාසහිත සමාගම 'A (lka)' මට්ටමින් සහතික කොට ඇති අතර හිමිකම් පෑම් වගකීම් ඉටුකිරීමේ සතුටුදායක තත්ත්වය මත ස්ථාවර මට්ටමක සිට ධනාත්මක මට්ටමක් දක්වා ගමන් කරන ඉදිරි දැක්මක් සහිතව කටයුතු කරයි. අප රටට දැඩි අභියෝගයක් වූ වසරක් තුළ අපගේ පාර්ශ්වකරුවන් අප කෙරෙහි තැබූ විශ්වාසය සහ දිගු කාලීන වටිනාකම් ලබා දීමේ පොරොන්දු අප විසින් තහවුරු කර ඇති බව මගේ විශ්වාසයයි.

**ජනතා කේන්ද්‍රීය වර්ධනය (People Driven Growth)**

අපගේ සාර්ථකත්වයේ ප්‍රධාන සාධකය වන්නේ අපගේ බෙදාහැරීමේ මාර්ග ශක්තිමත් කිරීම සඳහා බහුවිධ ක්‍රමෝපායන් භාවිතා කිරීමයි. අප සමඟ සිටින 2500ක් ඉක්ම වූ රක්ෂණ නියෝජිතයන් හට වටිනාකමක් ලබා දෙමින් ඔවුන්ට ඉහල මට්ටමේ ජයග්‍රහණ කරා මඟ පෙන්වීමට අපට හැකි වූයේ ඔවුන්ගේ ජීවනෝපායන්ට සහය දෙන අතරම ඔවුන්ව අභිප්‍රේරණය කර කාර්යසාධනය වැඩිකරමින් ය. අපගේ උත්සාහයන් මල්ඵල ගන්වමින් 2019 වර්ෂය පුරා පැවති අභියෝගාත්මක ව්‍යාපාර පරිසරය තුළ රක්ෂණ නියෝජිතයන් සංඛ්‍යා දෙකක දළ ලිඛිත රක්ෂන වාරික වර්ධනයක් ලබා දී ඇත. අපගේ දිගුකාලීන ක්‍රමෝපාය අනුව යමින් හඳුනාගත් ක්ෂේත්‍රවල බැංකු රක්ෂණ වැනලය වර්ධනය කිරීම සඳහා අපි අපගේ මව් සමාගම වන හැටන් නැෂනල් බැංකුව සමඟ ද කටයුතු කර ඇත. ඉහළ මට්ටමේ අවබෝධයක් සහ පාරිභෝගික පහසුව ඇති කිරීමේ හැකියාව ලබා දෙමින් අපගේ ජාලය තුළ අප සතුව බැංකු රක්ෂණ නිලධාරීන් 275 ක් සිටිති. මෙම ඒකාබද්ධ අලෙවිය අපගේ වර්ධනය වැඩදියුණු කරන අතර පාස්කු ඉරිදා ප්‍රහාරයට පසුව ඇතිවූ ආරක්ෂක තත්ත්වය මත 2019 අප්‍රේල් සහ මැයි යන මාසවල ඇතිවූ තාවකාලික පසුබෑම් කිහිපයක් හැර වසර පුරාම ස්ථාවර ගම්‍යතාවක් පවත්වා ගැනීමට හැකියාව ලැබී තිබේ. ධාරිතා වර්ධන මූලාරම්භයන් සමාගම විසින් 2019 වසර තුළ MDRT ජයග්‍රාහකයන් 75 ක් බිහිකිරීම තුළින් පිළිබිඹු වේ.

**ගනුදෙනුකරුවන්ට වටිනාකමක් (Value to Customers)**

අපගේ ගනුදෙනුකාර වටිනාකම පිළිබඳ ප්‍රතිපත්තිය, පුද්ගලික අලෙවි ආකෘති වලට බාධා කරමින් තාක්ෂණික ප්‍රගමනයන් ලෙස විකාශය වීම සිදුවේ. ඩිජිටල් ස්ථරය අපගේ ගනුදෙනුකාරභවතුන්ගේ අන්තර්ක්‍රියාකාරිත්වයන් වැඩිකර අපගේ වෙබ් අඩවිය හරහා ගනුදෙනු කිරීමේ දී තමන්ට පහසු ආකාරයට අන්තර්ක්‍රියාකාරී වීමට හැකියාව ලබා දෙයි. ඩිජිටල් දායකත්වයන් අපගේ න්‍යාය පත්‍රයේ අවධාරණය කර තිබෙන නිසා මෙය තවදුරටත් 2020 දීත් අඛණ්ඩව ක්‍රියාත්මක වනු ඇත. අපහසු කාලසීමාවල ඔබගේ ගමන ශක්තිමත් කිරීම සඳහා ඔබගේ වර්ධනයට අප සහාය ලබා දෙන නිසා HNBA වටිනාකම් මිශ්‍රය තුළ මුල් බැස තිබෙන්නේ විශ්වාසයයි. විශ්වාසය පෝෂණය කිරීම අපගේ විචක්ෂණශීලී අවදානම් පැතිකඩ තුළ සහ වසර තුළ අපගේ ශ්‍රේණිගතකිරීම් වර්ධනය වන ශක්තිමත් ආයතනික යහපාලන රාමුව තුළ කැපී පෙනේ.

නීත්‍යානුකූල හිමිකම් පෑම් ලබා දීම සහ හිමිකම් පෑම් ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම තුළද අප සමාගම විශ්වාසය වර්ධනය කර තිබේ. එසේම ගෙවන ලද හිමිකම්පෑම් අප විසින් ආරක්ෂාකරගෙන තිබෙන විශ්වාසය තහවුරු කිරීමේ සාක්ෂි වේ. ගනුදෙනුකරුවන්ගේ පැමිණිලි සම්බන්ධව කටයුතු කරන ගනුදෙනුකාර සබඳතා මධ්‍යස්ථාන මගින් ද මේ සඳහා සහාය ලැබෙන අතර මේ වසර තුළ ගනුදෙනුකරුවන්ගේ පැමිණිලි වල අඩුවක් දක්නට ලැබීම සතුටට කරුණකි. යම් කිසි හිමිකම් පෑමකට අදාල ගෙවීම ඔබට හැකි ඉක්මනින් ලබාදීම සඳහා හිමිකම්පෑමේ ක්‍රියාවලිය සිදුකිරීමට යන කාලය ද අප විසින් අඩු කර තිබේ. අප විසින් සිදුකරන ගනුදෙනුකාර වටිනාකම පිළිබඳ ප්‍රතිපත්තිය අප තවදුරටත් වර්ධනය කරන අතර ඉතාමත් දැඩි තරඟකාරී වෙළෙඳපොලක් තුල මෙය අප අන් අයගෙන් වෙන් කරන ශකිත්මත්ම සාධකය බව අපගේ විශ්වාසයයි.

**ජීවිත රක්ෂණ (Life Insurance)**

අපගේ අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ආක්‍රමණශීලී ක්‍රමෝපායන් හඹා යන අවස්ථාවක රක්ෂණ කර්මාන්තයේ වර්ධන වේගය වන 11% අභිබවමින්, 17% ක වර්ධනයක් සමග රු. බිලියන 5.2 ක දළ ලිඛිත රක්ෂන වාරිකයක් HNBA වාර්තා කර ඇත. වසර තුළ බදු පෙර ලාභය ලෙස රු. බිලියන 1.1 ක් වාර්තා කල HNBA ආයතය තම ජීවිත රක්ෂණ මෙහෙයුම් තුළ එක් වරක් පමණක් සිදුවන අයිතමයන් හැර බදු පෙර ලාභය 17% ක වර්ධනයක් වාර්තා කර තිබේ. 23% ක් වූ ආයෝජන ආදායම් වර්ධනය 2019 වසර තුළ කාර්යසාධනය මෙහෙයවීම සඳහා පහසුකම් සළසන ලදී. ජීවිත රක්ෂණ අරමුදල (Life Fund) 18% ක වර්ධනයක් පෙන්නුම් කරමින් රු. බිලියන 12 සිට රු. බිලියන 14 දක්වා වර්ධනය විය. වියදම් අනුපාතය ( Expense Ratio) 49% ක් ලෙස වෙනස් නොවී පැවතුණ අතර එයට හේතුව වන්නේ පවතින ධාරිතාවන් තුළ අප වැඩිවුණ ක්‍රියාකාරිත්වයන් ඉහළ ඵලදායිතාවකින් අවශෝෂණය කරගැනීම නිසාය.

HNBA සමාගම, අදාළ නිෂ්පාදන කළඹ, දැඩි සේ අභිප්‍රේරණයට ලක්වූ අලෙවි බලකායක්, ශක්තිමත් යහපාලනය සහ අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය සහ 309% ක ප්‍රාග්ධන ප්‍රමාණතා අනුපාතයක් (Capital Adequacy Ratio) සහිත ස්ථාවර ශේෂ පත්‍රයක් සහිතව වර්ධනය සඳහා මනා ලෙස සූදානම් තත්ත්වයක තිබේ.

**සාමාන්‍ය රක්ෂණය (General Insurance)**

සාමාන්‍ය රක්ෂණය ද ලාභදායිත්වයේ 8% ක වර්ධනයක් සහ රු මිලියන 250 ක බදු පසු ලාභයක් වාර්තා කරමින් වසර නිමකර තිබේ. රු. බිලියන 4.8 ක් වූ දළ ලිඛිත රක්ෂන වාරිකය 11% ක වර්ධනයක් පිළිබිඹු කරන අතර එය 5% ක් වන සාමාන්‍ය කර්මාන්ත වර්ධන වේගයට වඩා ඉහළ අගයක් ගනියි. මෝටර් වාහන ලියාපදිංචිය අඩුවීම නිසා සාමාන්‍ය රක්ෂණ ක්ෂේත්‍රයේ වර්ධනයට බලපෑමක් එල්ල විය. ආයෝජන ආදායමේ 15% ක වර්ධනය, ප්‍රවේශම් සහිත අවදානම් තොරාගැනීම සහ ප්‍රාරක්ෂණ මත පාලනයන් ලාභදායිත්වයට සහාය ලබාදුන් අතර මිල නියම කිරීමේ දී සහ අවදානම් භාරගැනීමේ දී කිසිදු විචලනයක් යොදාගෙන නැත. සාමාන්‍ය අවදානම් අවස්ථා නිසා විශාල ගෙවීම් සිදු කළද, දළ ලිඛිත රක්ෂන වාරික වල වර්ධනය නිසා 66% සිට 64% දක්වා අඩුවූ හිමිකම් පෑම් අනුපාතය (Claims Ratio) කලමනාකරණය කිරීමට අපට හැකිවිය. ඉහළ මට්ටමේ පිරිවැය සවිඥානිකත්වයක් පිළිබිඹු කරමින් වියදම් අනුපාතය (Expense Ratio) ආන්තික වශයෙන් 1% කින් ඉහළ ගොස් තිබේ.

අතිශය අභියෝගාත්මක වසරක් තුළ උසස් කාර්යසාධනයක් ලබා දීම සඳහා අපි වෙළෙඳපොල හැසිරීම පිළිබඳ මනා සැලකිල්ලෙන් යුතුව කටයුතු කලෙමු. අපගේ තෝරාගත් මාර්ගයේ ගමන් කිරීමට අවශ්‍යය උපාය මාර්ග සඳහා ශක්තිමත් ශේෂ පත්‍රයද සහයක් විය. HNBGI ප්‍රාග්ධන ප්‍රමාණතා අනුපාතය (Capital Adequacy Ratio) වසර අවසානයේ 223% වීම තුළ අවදානම කෙරෙහි අපේ දූරදර්ශී ප්‍රවේශය පිළිබිඹු කරයි.

**කොටස්හිමියන්ගේ වටිනාකම (Value to Shareholders)**

විවිධ වූ අභියෝගවලට අප මුහුණ දුන් වසරක් තුළ කොටස්හිමියන් සඳහා වූ වටිනාකම අප වැඩිකළ බව සතුටින් දන්වා සිටිමි. අපගේ වෙළෙඳපොල ප්‍රාග්ධනය 5% කින් රු. බිලියන 6.9 ක් දක්වා වැඩිවූ අතර HNBA හි අනාගතය තුළ වාසිදායක වෙළෙඳපොල අවබෝධයන් පිළිබිඹු කරමින් අපගේ කොටස් වල වටිනාකම රු. 132 සිට රු. 138 දක්වා වර්ධනය විය. මෙය කොටසක ශුද්ධ වත්කම් වටිනාකම වූ රු. 134.30 ට වඩා රු. 3.70 කින් වැඩි වූ අතර එය වසර අවසානයේ 17% ක වර්ධනයක් පිළිබිඹු කල හිමිකම් ප්‍රාග්ධනයට සමගාමී විය. ඊට අමතරව දැනට ඔබ අත තිබෙන කොටස් වලට කොටසකට රු. 2/- ක් වශයෙන් අතුරු ලාභාංශයක් අපි ප්‍රකාශයට පත් කර තිබෙන අතර මේ සඳහා එකතු කිරීමට රු. 6 ක අවසන් ලාභාංශයක් අපි යෝජනා කරමු.

HNBA සමාගම S&P 20-හි ඇතුලත් කිරීම කොටස්හිමියන් ට ලබා දුන් වටිනාකම මතු කර දැක්වීමට ඉවහල් විය. යහපාලනයේ සිට මූල්‍ය කාර්යසාධනය සහ ද්‍රවශීලතාව දක්වා පරාසයක දිවෙන සියළු නිර්ණායක වලට අනුකූල වීම එම ඇතුලත් කිරීම මගින් සහතික කරයි. වෙළෙඳ කටයුතු සඳහා කොටස් නොමැතිකම 2019 අගභාගයේ සමාගම S&P 20 වෙතින් ඉවත් වීමට බලපෑ අතර HNBA කොටස් වලට දිගුකාලීනව සම්බන්ධව සිටීමට කොටස්හිමියන්ගේ වූ කැපවීම සහ කැමැත්ත නිසා ප්‍රමාණවත් කොටස් වෙළෙඳාම සඳහා නොතිබීම එම කාරණාවට බලපා තිබෙන අතර එම නිසා මෙම තත්ත්වය ඇතිවී තිබේ.

**කණ්ඩායම් ක්‍රියාකාරිත්වය (Teamwork)**

මෙය නිතර භාවිත වන යෙදුමක් වුවද මෙම වසරේ සාර්ථක කාර්යසාධනය විස්තර කිරීම සඳහා ඊට වඩා සුදුසු යෙදුමක් සොයාගැනීම අපහසුය. ඉහළ මට්ටමේ කාර්යසාධනයක් සහිත කණ්ඩායමක් ගොඩනැගීම සඳහා අපගේ අරමුණු සහ ඉලක්ක පැහැදිලිව සන්නිවේදනය කිරීම, විස්තීරණ පුහුණු සහ සංවර්ධන වැඩසටහන් සමඟ වන ආයතනික සහ පුද්ගල ඉලක්ක, සාධාරණ වැටුප් ප්‍රතිපත්ති හරහා මනා ලෙස ගැලපීම මගින් මනා සහායක් ලබා දී තිබේ. මිත්‍රත්වය සහ එකිනෙකාගේ දායකත්වය සම්බන්ධයෙන් ඇති ගෞරවය අපගේ ප්‍රගතිය සඳහා සහ අප ආයතනික වටිනාකම් සහ අපගේ බාහිර පාර්ශ්වකරුවන්ට දිගුකාලීන වටිනාකම් ලබා දීම සඳහා යෝග්‍ය පරිසරයක් සකස් කරයි.

ශ්‍රී ලාංකිකයන්ගෙන් සැදුම් ලත් අපගේ හැකියාවන් ශක්තිමත් කිරීම අප අඛණ්ඩව සිදු කරන අතර සමාගමක් වශයෙන් සමාලෝචිත වර්ෂය තුළ පැවතුණ අහිතකර තත්ත්වයන් හමුවේ මනා ලෙස සංවර්ධනය වූ මානව සම්පත් හරහා වේගවත් ප්‍රතිඵල ලබා දීමට අපට හැකිවිය. දේශීය දක්ෂතාවන්ගේ හැකියාවන් පිළිබඳ කතා කිරීමේ දී අලෙවි කාර්යසාධනය හෝ මෙහෙයුම් කාර්යක්ෂමතාව යන කුමක් වුවත් ඒ පිළිබඳ ශක්තිමත් පණිවිඩයක් මෙමගින් ලබා දෙයි. අපගේ මූල්‍ය සහ තොරතුරු සන්නිවේදන කණ්ඩායම් ඉතාමත්ම අභියෝගාත්මක තත්ත්වයක් තුළ, ගිණුම්කරණ පද්ධතියක් ලෙස "ඔරකල්" ( Oracle) ඉතාමත් කෙටි කාලයක් ඇතුළත ක්‍රියාත්මක කල අතර මෙය ශ්‍රී ලංකාවේ කෙටිම කාලයක් ඇතුළත ක්‍රියාත්මක වූ ඔරකල් ව්‍යාපෘති විය.

**2020 අපගේ දර්ශනය (Our Vision for 2020)**

2020 සඳහා අපගේ තේමාව වන්නේ සේවා විශිෂ්ටත්වය, පාර්ශ්වකරුවන්ගේ වටිනාකම් නිර්මාණය, සේවක තෘප්තිය, ඩිජිටල් පරිවර්තනය, නවෝත්පාදක විශිෂ්ටත්වය සහ සමාජ භාරකාරත්වය මත පදනම් වූ හොඳම රක්ෂකයා වීමයි. මෙම එක් එක් කුළුණු තුළින් තව දුරටත් වර්ධනය වීමටත් තිරසාර වර්ධනයක් සහ අර්ථසිද්ධි ඇතිකර ගැනීමට මූලික වෙනස්කම් ඇතිකර ගැනීමටත් 2019 දමන ලද අඩිතාලම අපට පිටුවහලක් වනු ඇත.

**ඇගයීම (Appreciations)**

අපගේ අධ්‍යක්ෂ මණ්ඩලයට, විධායක කමිටුවට, කළමණාකාරිත්ව කණ්ඩායම් වලට සහ සමාගම් දෙකෙහි සියළු දෙනාටම සහ අපගේ අලෙවි බලකාය විසින් සමාලෝචිත වර්ෂය තුළ සාර්ථක කාර්ය සාධනයක් ළඟා කර ගැනීම සඳහා දැක්වූ ඉහළ මට්ටමේ වෘත්තීයවේදී භාවයට ස්තුති කිරීමට මම මෙය අවස්ථාවක් කර ගනිමි. එසේම අප මව් සමාගම වන හැටන් නැශනල් බැංකුව සහ අනෙකුත් කොටස් කරුවන් අප සමාගම වෙත ඉහළ විශ්වාසයක් තැබීම මම දැඩි සේ අගය කරමි. එසේම නියාමකයන්ට, රක්ෂණ තැරව්කරුවන්ට, ප්‍රතිරක්ෂණ සමාගම්වලට, අපගේ ජාල සහායකයන්ට, ගනුදෙනුකරුවන්ට සහ පොදු මහජනතාවට මෙම 2019 වර්ෂය සාර්ථකව අවසන් කිරීමට අප සමඟ එක්ව කටයුතු කිරීම සම්බන්ධයෙන් මගේ කෘතඥතාව පළ කරමි.

## HNB ඇෂුවරන්ස් PLC
## මූල්‍ය තත්ව ප්‍රකාශය

| | සමූහය | | සමාගම | |
|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනට, | **2019** | **2018** | **2019** | **2018** |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| **වත්කම්** | | | | |
| දේපළ, පිරියත හා උපකරණ | 162,371 | 151,559 | 111,202 | 104,487 |
| කල්බදු වත්කම් භාවිතා කිරීමේ අයිතිය | 343,737 | - | 325,572 | - |
| අස්පෘෂ්‍ය වත්කම් | 51,787 | 61,087 | 49,830 | 58,782 |
| විලම්භිත බදු වත්කම් | 1,009,711 | 1,304,882 | 1,000,673 | 1,280,499 |
| මූල්‍ය ආයෝජන | 21,202,074 | 17,579,131 | 17,777,410 | 14,679,706 |
| ආයෝජන - පරිපාලිත සමාගම | - | - | 1,150,000 | 1,150,000 |
| ජීවිත රක්ෂණ හිමියන්ට දී ඇති ණය | 325,307 | 243,113 | 325,307 | 243,113 |
| ලැබිය යුතු ප්‍රති රක්ෂණ | 645,411 | 415,773 | 144,715 | 75,926 |
| ලැබිය යුතු රක්ෂණ වාරික | 946,650 | 798,213 | 9,458 | 8,046 |
| වෙනත් වත්කම් | 933,633 | 823,101 | 625,499 | 575,154 |
| රක්ෂණ ගිවිසුම් – විලම්භිත වියදම් | 138,622 | 140,486 | - | - |
| මුදල් සහ මුදල් සමානතා | 865,843 | 761,871 | 632,712 | 502,561 |
| **මුළු වත්කම්** | **26,625,146** | **22,279,216** | **22,152,378** | **18,678,274** |
| | | | | |
| **හිමිකරු ප්‍රාග්ධනය සහ වගකීම්** | | | | |
| **මව් සමාගමේ මුළු හිමිකරු ප්‍රාග්ධනය** | | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 1,171,875 | 1,171,875 | 1,171,875 | 1,171,875 |
| රඳවාගත් ලාභ | 4,965,809 | 4,405,581 | 4,544,369 | 4,167,660 |
| විකිණීම සඳහා වර්ගීකරණය කරන ලද ආයෝජනයන්හි සංචිත | 24,801 | (8,025) | 9,881 | 1,451 |
| වෙනත් සංචිත | (6,525) | (4,406) | (6,514) | (4,395) |
| ජීවිත රක්ෂණ හිමියන්ගේ ආදායම් සංචිතය | 177,228 | (201,867) | 177,228 | (201,867) |
| සීමිත නියාමන සංචිතය | 381,156 | 381,156 | 381,156 | 381,156 |
| **මව් සමාගමේ මුළු හිමිකරු ප්‍රාග්ධනය** | 6,714,344 | 5,744,314 | 6,277,995 | 5,515,880 |
| පාලනයට නතුනොවන අයිතිය | - | - | - | - |
| **මුළු හිමිකරු ප්‍රාග්ධනය** | 6,714,344 | 5,744,314 | 6,277,995 | 5,515,880 |
| | | | | |
| **වගකීම්** | | | | |
| රක්ෂණ ප්‍රතිපාදන - ජීවිත රක්ෂණ | 14,464,534 | 12,261,472 | 14,464,534 | 12,261,472 |
| රක්ෂණ ප්‍රතිපාදන - සාමාන්‍ය රක්ෂණ | 2,871,416 | 2,525,095 | - | - |
| සේවක ප්‍රතිලාභ සඳහා වෙන්කිරීම් | 167,118 | 140,356 | 100,076 | 84,840 |
| වර්තමාන බදු වගකීම | 112,031 | 22,541 | 16,175 | 14,708 |
| ගෙවිය යුතු ප්‍රති රක්ෂණ | 540,652 | 369,853 | 125,151 | 116,268 |
| කල්බදු වගකීම් | 350,089 | - | 334,832 | - |
| වෙනත් වගකීම් | 1,274,326 | 1,092,809 | 802,565 | 642,470 |
| බැංකු අයිරාව | 130,636 | 122,776 | 31,050 | 42,636 |
| **මුළු වගකීම්** | 19,910,802 | 16,534,902 | 15,874,383 | 13,162,394 |
| | | | | |
| **මුළු හිමිකරු ප්‍රාග්ධනය සහ වගකීම්** | **26,625,146** | **22,279,216** | **22,152,378** | **18,678,274** |

ඉහත මූල්‍ය තත්ව ප්‍රකාශය, වාර්ෂික වාර්තාවේ පිටු අංක 184 හී ඇති විගණනය කරන ලද මූල්‍ය තත්ව ප්‍රකාශයේ පරිවර්තනයක් පමණී.

## HNB ඇෂුවරන්ස් PLC
## ලාභාලාභ හා වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශය

| | සමූහය | | සමාගම | | වෙනස | |
|---|---|---|---|---|---|---|
| **දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා,** | **2019** | **2018** | **2019** | **2018** | **සමූහය** | **සමාගම** |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | % | % |
| දළ ලේඛනගත රක්ෂණ වාරික | 9,942,757 | 8,724,696 | 5,175,044 | 4,420,513 | 14 | 17 |
| ප්‍රති රක්ෂකයන්ට කැපකළ වාරික | (1,312,881) | (1,059,269) | (240,974) | (215,630) | 24 | 12 |
| ශුද්ධ ලේඛනගත රක්ෂණ වාරික | 8,629,876 | 7,665,427 | 4,934,070 | 4,204,883 | 13 | 17 |
| නොඉපැයූ රක්ෂණ වාරිකවල සංචිතයේ ශුද්ධ වෙනස | (156,216) | (216,988) | - | - | (28) | - |
| **ඉපැයූ ශුද්ධ රක්ෂණ වාරික** | **8,473,660** | **7,448,439** | **4,934,070** | **4,204,883** | **14** | **17** |
| | | | | | | |
| **වෙනත් ආදායම්** | | | | | | |
| පොළී හා ලාභාංශ ආදායම | 2,248,926 | 1,887,343 | 1,949,467 | 1,591,900 | 19 | 22 |
| උපලබ්ධි වූ ශුද්ධ ලාභ | 92,856 | 74,058 | 70,000 | 68,673 | 25 | 2 |
| ශුද්ධ සාධාරණ අගය මත ලාභය/(අලාභය) | (8,826) | 8,482 | (6,370) | (18,036) | (204) | (65) |
| ගාස්තු සහ කොමිස් ආදායම් | 170,993 | 172,646 | 92,215 | 79,465 | (1) | 16 |
| වෙනත් ආදායම් | 16,196 | 36,030 | 2,965 | 14,627 | (55) | (80) |
| **මුළු වෙනත් ආදායම්** | **2,520,145** | **2,178,559** | **2,108,277** | **1,736,629** | **16** | **21** |
| **ශුද්ධ ආදායම** | **10,993,805** | **9,626,998** | **7,042,347** | **5,941,512** | **16** | **19** |
| | | | | | | |
| **ශුද්ධ ප්‍රතිලාභ, වන්දි සහ  වියදම්** | | | | | | |
| ශුද්ධ රක්ෂණ ප්‍රතිලාභ සහ ගෙවූ වන්දි | (3,524,768) | (3,123,585) | (1,325,145) | (1,035,164) | 13 | 28 |
| ශුද්ධ ගෙවියයුතු රක්ෂණ වන්දිවල වෙනස | (96,007) | (112,904) | (12,870) | (31,410) | (15) | (59) |
| ජීවිත රක්ෂණ සංචිතයේ ගිවිසුම්ගත වගකීම්හී වෙනස | (2,173,251) | (1,707,149) | (2,173,251) | (1,707,149) | 27 | 27 |
| ජීවිත රක්ෂණ සංචිතයේ ගිවිසුම්ගත වගකීම්හී වෙනස - එක් වරක් පමණක් තිබිය හැකි අතිරික්තය | - | 381,156 | - | 381,156 | (100) | (100) |
| වෙනත් මෙහෙයුම් සහ පරිපාලන වියදම් | (2,385,525) | (2,282,481) | (1,392,073) | (1,351,799) | 5 | 3 |
| ප්‍රාරක්ෂණ සහ ශුද්ධ අත්පත්කරගැනීමේ වියදම් | (1,288,068) | (1,125,418) | (959,550) | (847,968) | 14 | 13 |
| මූල්‍ය හා වෙනත් රක්ෂණ අදාළ වියදම් | (121,295) | (75,963) | (72,923) | (51,330) | 60 | 42 |
| **මුළු ප්‍රතිලාභ, වන්දි සහ වියදම්** | (9,588,914) | (8,046,344) | (5,935,812) | (4,643,664) | 19 | 28 |
| | | | | | | |
| **බදු පෙර ලාභය** | 1,404,891 | 1,580,654 | 1,106,535 | 1,297,848 | (11) | (15) |
| ආදායම් බදු | (394,663) | 1,124,656 | (279,826) | 1,177,367 | (135) | (124) |
| **වර්ෂය සඳහා වූ ලාභය** | **1,010,228** | **2,705,310** | **826,709** | **2,475,215** | **(63)** | **(67)** |
| | | | | | | |
| **වෙනත් විස්තීරණ ආදායම්,(බදු පසු)** | | | | | | |
| **ලාභාලාභ සඳහා නැවත වර්ගීකරණය කරන ලද  හෝ වර්ගීකරණය වියහැකි අයිතම** | | | | | | |
| - විකිණීම සඳහා වර්ගීකරණය කළ ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | 511,043 | (399,596) | 456,276 | (373,143) | 228 | 222 |
| - ආදායම් ප්‍රකාශයට මාරු කරන ලද  උපලබ්ධි වූ ලාභාලාභ | (92,836) | (72,541) | (68,751) | (67,960) | 28 | 1 |
| - ජීවිත රක්ෂණ හිමියන්ගේ ආදායම් සංචිතයට පවරන ලද විකිණීම සඳහා වර්ගීකරණය කළ ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | (379,095) | 425,139 | (379,095) | 425,139 | (189) | (189) |
| - ආශ්‍රිත බදු | (6,286) | 8,288 | - | - | (176) | - |
| **ලාභාලාභ සඳහා නැවත වර්ගීකරණය නොවන අයිතම** | | | | | | |
| ප්‍රතිමිනුම් මත ලාභ/(අලාභ) - සේවක ප්‍රතිලාභ සඳහා වෙන්කිරීම් | (2,119) | 6,354 | (2,119) | 5,489 | (133) | (139) |
| **වර්ෂය සඳහා මුළු වෙනත් විස්තීරණ ආදායම (බදු පසු)** | 30,707 | (32,356) | 6,311 | (10,475) | 195 | 160 |
| **වර්ෂයේ මුළු විස්තීරණ ආදායම** | 1,040,935 | 2,672,954 | 833,020 | 2,464,740 | (61) | (66) |
| | | | | | | |
| **මුළු ලාභය :** | | | | | | |
| ව්‍යාපාරයේ හිමිකරුවන්ට ආදළ වර්ෂයේ මුළු ලාභය | 1,010,228 | 2,705,310 | - | - | (63) | - |
| පාලනයට නතුනොවන අයිතිය | - | - | - | - | - | - |
| **වර්ෂයේ මුළු ලාභය** | 1,010,228 | 2,705,310 | - | - | (63) | - |
| | | | | | | |
| **මුළු විස්තීරණ ආදායම :** | | | | | | |
| ව්‍යාපාරයේ හිමිකරුවන්ට ආදළ වර්ෂයේ මුළු විස්තීරණ ආදායම | 1,040,935 | 2,672,954 | - | - | (61) | - |
| පාලනයට නතුනොවන අයිතිය | - | - | - | - | - | - |
| **වර්ෂයේ මුළු විස්තීරණ ආදායම** | 1,040,935 | 2,672,954 | - | - | (61) | - |
| | | | | | | |
| **කොටසක ඉපයීම** | | | | | | |
| කොටසක ඉපයීම - මූලික (රු.) | 20.20 | 54.11 | 16.53 | 49.50 | (63) | (67) |
| කොටසක ඉපයීම - මූලික (රු.) එක් වරක් පමණක් තිබිය හැකි අතිරික්තය - රහිතව | 20.20 | 46.48 | 16.53 | 41.88 | (57) | (61) |
| කොටසක ලාභාංශය (රු.) | - | - | 8.00 | 7.00 | - | 14 |

ඉහත ලාභාලාභ හා වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශය, වාර්ෂික වාර්තාවේ පිටු අංක 185 හී  විගණනය කරන ලද ලාභාලාභ හා වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශයේ පරිවර්තනයක් පමණි.

# HNB ඇෂුවරන්ස් PLC

## හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය - සමාගම

| 2019 දෙසැම්බර් 31 න් අවසන් වු වර්ෂය සඳහා, | ප්‍රකාශිත ප්‍රාග්ධනය | රඳවාගත් ඉපැයීම් | අලෙවි සංචිත | වෙනත් සංචිත | ජීවිත රක්ෂණ හිමියන්ගේ ආදායම් සංචිතය | සීමිත නියාමන සංචිතය | මුළු හිමිකම් |
|---|---|---|---|---|---|---|---|
| **2018 ජනවාරි 01 දිනට ශේෂය** | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 |
| වර්ෂයේ මුළු විස්තීරණ ආදායම | 1,171,875 | 2,373,601 | 17,415 | (9,884) | 223,272 | - | 3,776,279 |
| **වර්ෂය සඳහා වු ලාභය** | - | 2,094,059 | - | - | - | 381,156 | 2,475,215 |
| **වර්ෂය සඳහා වු වෙනත් විස්තීරණ ආදායම්,(බදු පසු)** | | | | | | | |
| - විකිණීම සඳහා වර්ගීකරණය කළ මූල්‍ය ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | - | - | (441,103) | - | - | - | (441,103) |
| - ජිවිත රක්ෂණ හිමියන්ගේ සංචිතයට පවරන ලද විකිණීම සඳහා වර්ගීකරණය කළ ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | - | - | 425,139 | - | - | - | 425,139 |
| - ප්‍රතිමිනුම් මත ලාභ - සේවක ප්‍රතිලාභ සඳහා වෙන්කිරීම් | - | - | - | 5,489 | - | - | 5,489 |
| **වර්ෂය සඳහා මුළු වෙනත් විස්තීරණ ආදායම** | - | - | (15,964) | 5,489 | - | - | (10,475) |
| **වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම** | - | 2,094,059 | (15,964) | 5,489 | - | 381,156 | 2,464,740 |
| ජිවිත රක්ෂණ හිමියන්ගේ සංචිත අරමුදලට පවරන ලද විකිණීම සඳහා වර්ගීකරණය කළ ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | - | - | - | - | (425,139) | - | (425,139) |
| **හිමිකරුවන් සමග සිදුවු, ස්කන්ධයේ සෘජුවම සටහන් කරන ලද ගනුදෙනු ව්‍යාපාරයේ හිමිකරුවන්ට කරන ලද බෙදාහැරීම්** | | | | | | | |
| 2017 වර්ෂය සඳහා වු අවසාන ලාභාංශ ගෙවීම් | - | (300,000) | - | - | - | - | (300,000) |
| **2018 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 1,171,875 | 4,167,660 | 1,451 | (4,395) | (201,867) | 381,156 | 5,515,880 |
| **2019 ජනවාරි 01 දිනට ශේෂය** | 1,171,875 | 4,167,660 | 1,451 | (4,395) | (201,867) | 381,156 | 5,515,880 |
| වර්ෂයේ මුළු විස්තීරණ ආදායම | | | | | | | |
| **වර්ෂය සඳහා වු ලාභය** | - | 826,709 | - | - | - | - | 826,709 |
| **වෙනත් විස්තීරණ ආදායම්,(බදු පසු)** | | | | | | | |
| - විකිණීම සඳහා වර්ගීකරණය කළ මූල්‍ය ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | - | - | 387,525 | - | - | - | 387,525 |
| - ජිවිත රක්ෂණ හිමියන්ගේ සංචිතයට පවරන ලද විකිණීම සඳහා වර්ගීකරණය කළ ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | - | - | (379,095) | - | - | - | (379,095) |
| - ප්‍රතිමිනුම් මත අලාභ - සේවක ප්‍රතිලාභ සඳහා වෙන්කිරීම් | - | - | - | (2,119) | - | - | (2,119) |
| **වර්ෂය සඳහා මුළු වෙනත් විස්තීරණ ආදායම** | - | - | 8,430 | (2,119) | - | - | 6,311 |
| **වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම** | - | 826,709 | 8,430 | (2,119) | - | - | 833,020 |
| ජිවිත රක්ෂණ හිමියන්ගේ සංචිතයට පවරන ලද විකිණීම සඳහා වර්ගීකරණය කළ ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | - | - | - | - | 379,095 | - | 379,095 |
| **හිමිකරුවන් සමග සිදුවු, ස්කන්ධයේ සෘජුවම සටහන් කරන ලද ගනුදෙනු ව්‍යාපාරයේ හිමිකරුවන්ට කරන ලද බෙදාහැරීම්** | | | | | | | |
| 2018 වර්ෂය සඳහා වු අවසාන ලාභාංශ ගෙවීම් | - | (350,000) | - | - | - | - | (350,000) |
| 2019 වර්ෂය සඳහා වු පළමු අතුරු ලාභාංශ ගෙවීම් | - | (100,000) | - | - | - | - | (100,000) |
| **2019 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 1,171,875 | 4,544,369 | 9,881 | (6,514) | 177,228 | 381,156 | 6,277,995 |

ඉහත හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය - සමාගම, වාර්ෂික වාර්තාවේ පිටු අංක 187 හී ඇති විගණනය කරන ලද හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශයේ පරිවර්තනයක් පමණි.

# HNB ඇෂුවරන්ස් PLC

## හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය - සමූහය

| 2019 දෙසැම්බර් 31 න් අවසන් වු වර්ෂය සඳහා, | ප්‍රකාශිත ප්‍රාග්ධනය | රඳවාගත් ඉපැයීම් | අලෙවි සංචිත | වෙනත් සංචිත | ජීවිත රක්ෂණ හිමියන්ගේ ආදායම් සංචිතය | සීමිත නියාමන සංචිතය | මුළු හිමිකම් |
|---|---|---|---|---|---|---|---|
| | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 |
| **2018 ජනවාරි 01 දිනට ශේෂය** | 1,171,875 | 2,381,427 | (30,865) | (10,760) | (223,272) | - | 3,796,499 |
| වර්ෂයේ මුළු විස්තීරණ ආදායම | | | | | | | |
| **- වර්ෂය සඳහා වු ලාභය** | **-** | **2,324,154** | **-** | **-** | **-** | **381,156** | **2,705,310** |
| **වෙනත් විස්තීරණ ආදායම්,(බදු පසු)** | | | | | | | |
| - විකිණීම සඳහා වර්ගීකරණය කළ මුල්‍ය ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | - | - | (463,849) | - | - | - | (463,849) |
| - ජීවිත රක්ෂණ හිමියන්ගේ සංචිතයට පවරන ලද විකිණීම සඳහා වර්ගීකරණය කළ ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | - | - | 425,139 | - | - | - | 425,139 |
| - ප්‍රතිමිනුම් මත ලාභ - සේවක ප්‍රතිලාභ සඳහා වෙන්කිරීම් | - | - | - | 6,354 | - | - | 6,354 |
| වර්ෂය සඳහා මුළු වෙනත් විස්තීරණ ආදායම | - | - | (38,710) | 6,354 | - | - | (32,356) |
| වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම | - | 2,324,154 | (38,710) | 6,354 | - | 381,156 | 2,672,954 |
| ජීවිත රක්ෂණ හිමියන්ගේ සංචිතයට පවරන ලද විකිණීම සඳහා වර්ගීකරණය කළ ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | - | - | - | - | (425,139) | - | (425,139) |
| **හිමිකරුවන් සමග සිදුවු, ස්කන්ධයේ සෘජුවම සටහන් කරන ලද ගනුදෙනු ව්‍යාපාරයේ හිමිකරුවන්ට කරන ලද බෙදාහැරීම්** | | | | | | | |
| 2017 වර්ෂය සඳහා වු අවසාන ලාභාංශ ගෙවීම් | - | (300,000) | - | - | - | - | (300,000) |
| 2018 දෙසැම්බර් 31 දිනට ශේෂය | **1,171,875** | **4,405,581** | **(8,025)** | **(4,406)** | **(201,867)** | **381,156** | **5,744,314** |
| **2019 ජනවාරි 01 දිනට ශේෂය** | 1,171,875 | 4,405,581 | (8,025) | (4,406) | (201,867) | 381,156 | 5,744,314 |
| වර්ෂයේ මුළු විස්තීරණ ආදායම | | | | | | | |
| **- වර්ෂය සඳහා වු ලාභය** | **-** | **1,010,228** | **-** | **-** | **-** | **-** | **1,010,228** |
| **වෙනත් විස්තීරණ ආදායම්,(බදු පසු)** | | | | | | | |
| - විකිණීම සඳහා වර්ගීකරණය කළ මුල්‍ය ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | - | - | 411,921 | - | - | - | 411,921 |
| - ජීවිත රක්ෂණ හිමියන්ගේ සංචිතයට පවරන ලද විකිණීම සඳහා වර්ගීකරණය කළ ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | - | - | (379,095) | - | - | - | (379,095) |
| - ප්‍රතිමිනුම් මත අලාභ - සේවක ප්‍රතිලාභ සඳහා වෙන්කිරීම් | - | - | - | (2,119) | - | - | (2,119) |
| **වර්ෂය සඳහා මුළු වෙනත් විස්තීරණ ආදායම** | **-** | **-** | **32,826** | **(2,119)** | **-** | **-** | **30,707** |
| **වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම** | **-** | **1,010,228** | **32,826** | **(2,119)** | **-** | **-** | **1,040,935** |
| ජීවිත රක්ෂණ හිමියන්ගේ සංචිතයට පවරන ලද විකිණීම සඳහා වර්ගීකරණය කළ ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | - | - | - | - | 379,095 | - | 379,095 |
| **හිමිකරුවන් සමග සිදුවු, ස්කන්ධයේ සෘජුවම සටහන් කරන ලද ගනුදෙනු ව්‍යාපාරයේ හිමිකරුවන්ට කරන ලද බෙදාහැරීම්** | | | | | | | |
| 2018 වර්ෂය සඳහා වු අවසාන ලාභාංශ ගෙවීම් | - | (350,000) | - | - | - | - | (350,000) |
| 2019 වර්ෂය සඳහා වු පළමු අතුරු ලාභාංශ ගෙවීම් | | (100,000) | - | - | - | - | (100,000) |
| **2019 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **1,171,875** | **4,965,809** | **24,801** | **(6,525)** | **177,228** | **381,156** | **6,714,344** |

ඉහත හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය - සමූහය , වාර්ෂික වාර්තාවේ පිටු අංක 186 හී ඇති විගණනය කරන ලද හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශයේ පරිවර්තනයක් පමණි.

# HNB ඇෂුවරන්ස් PLC

## මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා, | | සමූහය | | සමාගම | |
|---|---|---|---|---|---|
| | | 2019 | 2018 | 2019 | 2018 |
| | | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා ලද මුදල් ප්‍රවාහ** | | | | | |
| බදු පෙර ලාභය | | 1,404,891 | 1,580,654 | 1,106,535 | 1,297,848 |
| **ගැලපීම්:** | | | | | |
| පොළී ආදායම | | (2,243,284) | (1,883,053) | (1,884,977) | (1,588,206) |
| ලාභාංශ ආදායම | | (5,642) | (4,290) | (64,490) | (3,694) |
| අස්පෘෂ්‍ය වත්කම් ක්‍රමක්ෂය | | 18,885 | 19,685 | 18,469 | 19,540 |
| දේපල පිරියත හා උපකරණ ක්ෂය | | 47,319 | 49,285 | 32,593 | 34,533 |
| භාවිතයට ඇති කල්බදු වත්කම් අයිතිය ශුද්ධ ක්ෂයවීම | | 139,525 | - | 126,628 | - |
| කල්බදු ණයහිමියාගේ පොළී වියදම | | 53,710 | - | 51,699 | - |
| සේවක ප්‍රතිලාභ සඳහා වෙන් කිරීම් | | 37,136 | 33,928 | 21,656 | 20,023 |
| උපලබ්ධි වූ ශුද්ධ ලාභ | | (92,856) | (74,058) | (70,000) | (68,673) |
| ශුද්ධ සාධාරණ අගය මත (ලාභ)/අලාභ | | 8,826 | (8,482) | 6,370 | 18,036 |
| දේපල පිරියත හා උපකරණ විකුණුම් ලාභ | | (4,283) | (178) | 403 | (171) |
| | | (635,773) | (286,509) | (655,114) | (270,764) |
| මෙහෙයුම් වත්කම් වල ශුද්ධ වෙනස | (අ) | (558,137) | 132,856 | (219,553) | (5,350) |
| මෙහෙයුම් වගකීම් වල ශුද්ධ වෙනස | (ආ) | 2,898,914 | 1,706,125 | 2,380,061 | 1,498,548 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා ලද මුදල් ප්‍රවාහ | | 1,705,004 | 1,552,472 | 1,505,394 | 1,222,434 |
| ගෙවූ පාරිතෝෂිකය | | (12,493) | (13,301) | (8,539) | (4,618) |
| ආර්ථික සේවා ගාස්තු | | (22,205) | (20,120) | - | - |
| අතුරු සමාගම් ලාභාංශ සඳහා රඳවා ගැනීමේ බද්ද | | (9,575) | - | - | - |
| ගෙවූ ප්‍රාග්ධන ලාභ බදු | | (814) | - | - | - |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහ | | 1,659,917 | 1,519,051 | 1,496,855 | 1,217,816 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා ලද මුදල් ප්‍රවාහ** | | | | | |
| ආයෝජන සුරැකුම් මිලදී ගැනුම් | | (135,558,700) | (95,081,304) | (97,671,001) | (66,144,150) |
| මූල්‍ය ආයෝජන වල කල්පිරීමෙන් ලද මුදල් | | 130,618,738 | 91,105,285 | 93,759,085 | 62,867,216 |
| මූල්‍ය ආයෝජන විකිණීමෙන් ලද මුදල් | | 1,684,919 | 993,726 | 1,173,551 | 869,073 |
| ලද පොළී | | 2,377,621 | 1,951,531 | 1,976,793 | 1,666,911 |
| ලද ලාභාංශ | | 5,933 | 4,493 | 64,750 | 3,760 |
| අස්පෘෂ්‍ය වත්කම් මිලදී ගැනුම් | | (9,585) | (22,931) | (9,517) | (20,481) |
| දේපල පිරියත හා උපකරණ මිලදී ගැනුම් | | (59,965) | (34,459) | (40,469) | (22,113) |
| දේපල පිරියත හා උපකරණ විකුණුම් සඳහා ලද මුදල් | | 6,117 | 3,413 | 758 | 2,342 |
| කල්බදු වත්කම් භාවිතා කිරීමේ අයිතිය සඳහා ගෙවූ අත්තිකාරම් | | (30,363) | - | (22,587) | - |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා යොදා ගත් ශුද්ධ මුදල් ප්‍රවාහ** | | (965,285) | (1,080,246) | (768,637) | (777,442) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා ලද මුදල් ප්‍රවාහ** | | | | | |
| ලාභාංශ ගෙවීම් | | (450,000) | (300,000) | (450,000) | (300,000) |
| කල්බදු වගකීම් ගෙවීම් | | (148,520) | - | (136,481) | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා යොදා ගත් ශුද්ධ මුදල් ප්‍රවාහ** | | (598,520) | (300,000) | (586,481) | (300,000) |
| **මුදල් සහ මුදල් වලට සමාන වත්කම් වල ශුද්ධ (අඩුවීම)/වැඩිවීම** | | 96,112 | 138,805 | 141,737 | 140,374 |
| වසර මුල මුදල් සහ මුදල් වලට සමාන වත්කම් | | 639,095 | 500,290 | 459,925 | 319,551 |
| **වසර අවසානයේ මුදල් සහ මුදල් වලට සමාන වත්කම්** | | 735,207 | 639,095 | 601,662 | 459,925 |

**මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළිබඳ සටහන්**

| **(අ) මෙහෙයුම් වත්කම් වල වෙනස** | | | | |
|---|---|---|---|---|
| විලම්භිත වියදම් වල අඩුවීම්/(වැඩිවීම්) | 1,864 | (35,199) | - | - |
| ජීවිත රක්ෂණ හිමියන්ට දී ඇති ණය වල වැඩි වීම් | (82,194) | (80,828) | (82,194) | (80,828) |
| ලැබිය යුතු ප්‍රතිරක්ෂණ වල අඩුවීම්/(වැඩිවීම්) | (229,638) | 154,005 | (68,789) | (10,916) |
| ලැබිය යුතු රක්ෂණ වාරිකයන්හී වැඩිවීම් | (148,437) | (11,894) | (1,412) | (558) |
| මුළු වෙනත් වත්කම් වල අඩුවීම්/(වැඩිවීම්) | (99,732) | 106,772 | (67,158) | 86,952 |
| **මෙහෙයුම් වත්කම් වල ශුද්ධ වෙනස** | (558,137) | 132,856 | (219,553) | (5,350) |

| **(ආ) මෙහෙයුම් වගකීම් වල වෙනස** | | | | |
|---|---|---|---|---|
| අනෙකුත් වගකීම් වල වැඩි වීම් | 177,265 | 188,803 | 166,649 | 112,608 |
| රක්ෂණ ප්‍රතිපාදන – ජීවිත රක්ෂණ වල වැඩි වීම් - බදු පෙර | 2,204,529 | 1,360,322 | 2,204,529 | 1,360,322 |
| රක්ෂණ ප්‍රතිපාදන – සාමාන්‍ය රක්ෂණ වල වැඩි වීම් | 346,321 | 140,189 | - | - |
| ගෙවිය යුතු ප්‍රතිරක්ෂණ – වැඩි වීම් | 170,799 | 16,811 | 8,883 | 25,618 |
| **මෙහෙයුම් වගකීම් වල ශුද්ධ වෙනස** | 2,898,914 | 1,706,125 | 2,380,061 | 1,498,548 |

ඉහත මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වාර්ෂික වාර්තාවේ පිටු අංක 188 හී ඇති විගණනය කරන ලද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ පරිවර්තනයක් පමණී.